පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 07

# අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය :- පෙරදිග සංගීතය

පාසලේ නම : ..............................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය පැය 02

❖ 01 සිට 10 තෙක් ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. සප්තකයක ඇති චල ස්වර ගණන වනුයේ,

I. දෙකකි. II. හතරකි. III. පහකි. IV. හයකි.

02. ශුද්ධ ස්වරයට වඩා හඬ වැඩිව පිහිටන්නේ,

I. කෝමල ස්වර II. තීව්‍ර ස්වර III. විකෘති ස්වර IV. මන්ද්‍ර ස්වර

03. ම ප ධ නි යන ස්වර

I. උච්ඡ සප්තකයට අයත් ය. II. මන්ද්‍ර සප්තකයට අයත් ය.

III. මධ්‍ය සප්තකයට අයත් ය. IV.විකෘති ස්වරවලට අයත් ය.

04. ස -, ස රි ස -, ස රි ග රි ස -. මෙම ස්වර අභ්‍යාසයේ මීළඟ පියවර වන්නේ,

I.සරිගමගරිස - II.සරිගමපමගරිස - III.සරිගපගරිස- IV.සරිගපමගරිස -

05. තාලය පෙන්වීම සඳහා භාවිතා කළ නොහැකි සංගීත භාණ්ඩයකි,

I.තම්මැට්ටම II.දවුල III.තාලම්පට IV.සර්පිනාව

06. "දකුණ නැගෙනහිර බටහිර උතුර ද" යන ගී පාදය

I.මාත්‍රා 2න් 2 බෙදේ II.මාත්‍රා 3න් 3 බෙදේ

III.මාත්‍රා 4න් 4 බෙදේ IV.මාත්‍රා 2,3 වශයෙන් බෙදේ

07. තාලම්පටින් නිකුත් වන ධ්වනි දෙක වන්නේ,

I.තා, ධිං II.නා, තා III.දොම්,කිට IV.තිත්,තෙයි

08. උපදේශාත්මක ගීතයකට අයත් ගී පාදය කුමක් ද?

I.නොමග නොයන් පුතේ II.කඳු පෙළ අතරේ

III.හෝ හෝ ගා රැල්ල බිඳෙනවා IV.ඕලු පිපීලා විල ලෙල දෙනවා

09. ස්වර පුවරු භාණ්ඩ ගණයට අයත් නොවන භාණ්ඩයකි,

I.මෙලෝඩිකාව II.විද්‍යුත් ස්වර පුවරුව III.සර්පිනාව IV.මවුත් ඕගන්

10. වයලීනයක ඇති තත් ගණන,

I.4කි. II.5කි. III.6කි. IV.8කි.

❖ 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.

(රබන් ගී , රාමායනය , පහතරට , පෙරදිග මුතු ඇටයයි මේ , හින්දුස්ථානි)

11.“අඹ දඹ නාරං කෙසෙල් දෙල්” යන ගීතය____________________නූර්තියට අයත් වේ.

12.______________________ගීතය සමගුහයෙන් ගැයේ.

13.කෝලම් නාට්‍ය___________________ජන නාට්‍ය විශේෂයකි.

14.________________නර්තනය සමඟ බැඳී පවතින ගීත විශේෂයකි.

15.නූර්ති ගීත සඳහා____________________සංගීතයේ ආභාෂය ලැබී ඇත.

❖ අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර යා කරන්න.

| | | |
|---|---|---|
| 16. | රත්න දීප ජන්ම භූමි | සාමූහිකව ගායනා කරයි. |
| 17. | ඇල් ගී | විදුර නාට්‍යයේ එන ගීයකි. |
| 18. | උඩු නියරෙන් වැටී ගෙනේ | විලම්භලය වේ. |
| 19. | සංගීතයේ දී අඩු වේගය | දේශභිමානි ගීතයකි. |
| 20. | දම් වැසි වස්සන ලෝකේ | දරු නැළවිලි ගීයකි. |

(2 × 20 = 40)

## II කොටස

❖ තෝරාගත් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(1) හින්දුස්ථානි සංගීතයේ එන ස්වර ප්‍රභේද ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

<table>
<tr><td rowspan="2">ප්‍රකෘති ස්වර (ශුද්ධ ස්වර) →</td><td>චල ස්වර →</td><td>_ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _</td></tr>
<tr><td>_ _ _ _ _ _ _ →</td><td>ස , ප</td></tr>
<tr><td rowspan="2">_ _ _ _ _ _ _ →</td><td>කෝමල ස්වර →</td><td>_ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _</td></tr>
<tr><td>_ _ _ _ _ _ _ →</td><td>ම´</td></tr>
<tr><td colspan="2">මුළු ස්වර ගණන (පිළිවෙළින්) →</td><td>_ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _</td></tr>
</table>

(2 × 6 = 12)

(2) I.ත්‍රිවිධ සප්තකය නම් කොට එම සප්තකවලට අයත් ස්වර පිළිවෙළින් ලියන්න. (ල. 06)

II.ස්වර පුවරු භාණ්ඩයක දළ රූපසටහනක් ඇඳ ස්වර 12 ලකුණු කරන්න. (ල. 06)

(3) I."තාලය" යන්න කෙටියෙන් හඳුන්වන්න. (ල. 02)

II.මාත්‍රා 3න් 3ට බෙදෙන හින්දුස්ථානී තාලය නම්කර එය නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න (ල. 06)

III.ඉහත තාලය හා ගැළපෙන දේශීය තිතට අදාළ බෙර පදයක් ප්‍රස්තාර කරන්න. (ල. 04)

(4) I."ග්‍රහ" යන්න කෙටියෙන් හඳුන්වන්න. (ල. 02)

II.පහත සඳහන් ගීත විවිධ ග්‍රහ යටතේ වෙන්කර ලියන්න.

(a)රත්න දීප ජන්ම භූමි (b)මට මැණි වගේ (c)අම්මා මාව දොයි කරන්න

(d)ඉරෙන් හඳෙන් (e)අම්මා සඳකි (f)හෙළ ජාතික අභිමානේ

| සම ග්‍රහ | අව ග්‍රහ | විෂම ග්‍රහ |
|---|---|---|
| | | |

(ල. 06)

III.ඔබ දන්නා උපදේශාත්මක ගීතයක් ලියන්න. (ල. 04)

(5) I.රබන් ගී පිළිබඳ ඔබ දන්නා කරුණු හතරක් ලියන්න. (ල. 08)

II.ඔබ උගත් රබන් ගීතයක් ලියා දක්වන්න. (ල. 04)

(6) I.කෝලම් නාට්‍යයෙහි භාවිතා කරන සංගීත භාණ්ඩ දෙකක් නම් කරන්න. (ල. 02)

II.කෝලම් නාට්‍ය පිළිබඳ කරුණු හතරක් ලියන්න. (ල. 08)

III. ඔබ උගත් කෝලම් ගීයක් ලියා දක්වන්න. (ල. 02)

(7)පහත සඳහන් මාතෘකා අතුරින් මාතෘකා තුනක් පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න.

(a)නුර්ති (b)ලය

(c)දැල් ගී (d)දරු නැළවිලි ගී

(ල. 4 × 3 = 12)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න